# රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

## ලංසු සඳහා ආරාධනා (IFB)

**රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ස්වදේශ කටයුතු අංශය යටතේ ඇති ආයතන සඳහා නිල ඊ-මේල් සේවාවක් ප්‍රසම්පාදනය කිරීම**
**HA/F/PRO/05/e-GN/Proc-5**

1. රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ (MPC) සභාපති විසින් ඉහත ප්‍රසම්පාදනය සඳහා සුදුසුකම් ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

2. රජයේ නිල ඊ-මේල් සේවාවක් ක්‍රියාත්මක කිරීම සඳහා මේඝ යටිතල පහසුකම් (Cloud Infrastructure) සහ මානව සම්පත් ඇතුළු සම්පත් යෙදවීමේ හැකියාව ඇති වෘත්තීය ඊ-මේල් සේවා සපයන්නෙකුගේ සේවය රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ උපදේශනය යටතේ වසරක (01) කාලයක් සඳහා පරිශීලක ගිණුම් 15,000ක් සේවා සැපයීම මේ යටතේ අපේක්ෂා කෙරේ.

3. 2006 දී ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනය (NPA) විසින් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල අර්ථ දක්වා ඇති ජාතික තරඟකාරී ලංසු තැබීමේ (NCB) ක්‍රියා පටිපාටිය භාවිතා කරමින් මෙම ලංසු කැඳවීම සිදු කෙරේ.

4. අවශ්‍ය සුදුසුකම් පහත දැක්වේ:

   i. ලංසුකරු ශ්‍රී ලංකාවේ නීත්‍යානුකූලව ලියාපදිංචි ඊ-මේල් සේවා සපයන සමාගමක් විය යුතු ය.
   ii. එම සමාගමට සහ එහි ලංසු හවුල්කරුවන්ට (JVs) (ඇත්නම්) සමාන සේවා සැපයීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්දක් තිබිය යුතු ය.
   iii. අපේක්ෂිත ලංසුකරු පසුගිය වසර පහ (05) තුළ අවම වශයෙන් සමාන ස්වභාවයකින් සහ ධාරිතාවයකින් යුත් ව්‍යාපෘති තුනක් (03) සාර්ථකව නිම කර තිබිය යුතු ය.
   iv. පසුගිය වසර පහ (05) ඇතුළත අවම වශයෙන් ඊ-මේල් ගිණුම් 1,500ක් සහිත එක් ව්‍යාපෘතියක් හෝ ස්ථාපනය කිරීම, වින්‍යාස කිරීම (Configuration) සහ නඩත්තු කිරීම පිළිබඳ පළපුරුද්ද තිබිය යුතු ය.
   v. සමාගමේ සාමාන්‍ය වාර්ෂික පිරිවැටුම රු. මිලියන 25කට වඩා වැඩි විය යුතු ය.
   vi. හවුලේ ලංසු ඉදිරිපත් කිරීමට අවසර ඇති අතර, එවැනි හවුල්වල සියලුම පාර්ශ්වයන් ශ්‍රී ලංකාවේ නීත්‍යානුකූලව ලියාපදිංචි සමාගම් විය යුතු ය. මෙම ආකාරයේ ලංසුවක් යටතේ, එක් පාර්ශ්වයක් ඊ-මේල් ගිණුම් කළමනාකරණය කිරීම අනිවාර්යයෙන් භාරව සිටිය යුතු අතර, අනෙක් පාර්ශ්වයට ශ්‍රී ලංකා භූමිය තුළ භෞතිකව පිහිටා ඇති මේඝ යටිතල පහසුකම් (Cloud Infrastructure) සහ අදාළ බලපත්‍ර සමගින් ප්‍රමාණවත් තාක්ෂණික හැකියාවක් තිබිය යුතු ය.
   vii. ලංසු ඉදිරිපත් කිරීමේ අවසාන දිනයෙන් පසු දින අනූ එකක (91) කාල සීමාවක් සඳහා ලංසු වලංගු විය යුතු අතර, සියලුම ලංසු සමඟ ලංසු ලේඛනයේ දක්වා ඇති ආකෘතියට අනුව රුපියල් 400,000/- ක ලංසු සුරක්ෂණයක් (Bid Security) තිබිය යුතුය. (මෙම ලංසු සුරක්ෂණය 2023.06.07 දින දක්වා වලංගු විය යුතුය)

5. පහත ලිපිනයට ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීම මත උනන්දුවක් දක්වන ලංසුකරුවන් විසින් ඉංග්‍රීසි භාෂාවෙන් යුත් සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් 2023.01.25 සිට 2023.02.07 දක්වා වැඩ කරන දිනවල

පෙ.ව. 09.00 සිට ප.ව 15.00 දක්වා කාලය තුළ සරප් වෙත රු. 10,000/- ක ආපසු නොගෙවන ගාස්තුවක් මුදලින් ගෙවා මෙම අමාත්‍යාංශයේ මූල්‍ය අංශයෙන් මිලදී ගත හැකි ය.

6. ලංසුකරුවන්ට ගණකාධිකාරී (ප්‍රසම්පාදන), රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය, 16 වැනි මහල, "නිල මැදුර", ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05 යන ලිපිනයෙන් වැඩිදුර තොරතුරු ලබාගත හැකි ය. (දුරකථන-: 0112050414, ෆැක්ස්-: 0112369181, ඊ-මේල් ලිපිනය-: procurement@moha.gov.lk / procurement.ha@gmail.com

7. මිල ගණන් ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, 16 වන මහල, "නිල මැදුර", ඇල්විටිගල මාවත, නාරාහේන්පිට වෙත 2023.02.08 දින ප.ව. 14.00 ට හෝ ඊට පෙර බාර දිය යුතුය.

8. ප්‍රමාද වූ ලංසු සහ ඉලෙක්ට්‍රොනිකව එවනු ලබන ලංසු පිළි නොගන්නා අතර, ඒවා ප්‍රතික්ෂේප කරනු ලැබේ.

9. ලංසු ඉදිරිපත් කිරීම සඳහා නියමිත කාලසීමාව අවසන් වූ වහාම ලංසුකරුවන් හෝ සහභාගී වීමට තෝරා ගන්නා ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් ඉදිරියේ "නිල මැදුර" 16 වැනි මහලේ මූල්‍ය අංශයේ දී මිල ගණන් විවෘත කරනු ලැබේ.

10. ලංසු සකස් කිරීම හෝ භාරදීම සම්බන්ධයෙන් ලංසුකරුවන් විසින් දරනු ලබන යම් පිරිවැයක් හෝ වියදම් සඳහා අමාත්‍යාංශය වගකියනු නොලැබේ.

සභාපති,<br>
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,<br>
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය<br>
"නිල මැදුර",<br>
ඇල්විටිගල මාවත,<br>
නාරාහේන්පිට,<br>
කොළඹ 05.<br>
2023.01.25